පුරාණ ගල් පාලම් ඉදිකිරීමේදී භාවිත වූ තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයක්

එම්. ඩී. අයි. කේ. අබේනායක[1] සහ ගාමිණී සමරනායක[2]
[1]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය; [2]පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
inojmms@yahoo.comaminiabeysiri@gmail.com

මහින්දාගමනයෙන් අනතුරුව දියුණුවට පත්වන නගර සංකල්පය හේතුකොට අනෙකුත් ප්‍රාදේශීය පාලන ඒකක මෙන්ම වෙනත් රටවල් අතර සබඳතාව ගොඩ නැගීම උදෙසා ප්‍රධාන වරායයන් හා බැඳුණු ක්‍රමවත් මාර්ග පද්ධතියක ඇති අවශ්‍යතාව තදින් දැනෙන්නට විය. ඒ අනුව අග නගරය මූලිකකොට සිව්දිසාවන්ට මාර්ග ඉදිකරන්නට පාලකයෝ කටයුතු කළහ. අනුරාධපුරය කේන්ද්‍රගතකොට ඉදිවූ මෙම මාර්ග පද්ධතිය මල්වතු ඔය, කණදරා ඔය, යාන් ඔය හා කලා ඔය ආදී ප්‍රධාන ජල මාර්ග හරහා යොමුව පැවතියෙන් ඒවා තරණය කිරීමට පාලම් තැනීමත්, නඩත්තුකර නිසිලෙස පවත්වා ගැනීමත් අගනුවර පරිපාලන ඒකකයේ ප්‍රධාන වගකීම විය. මුල්කාලීනව දැවදඬු භාවිත කරමින් පාලම් ඉදිකෙරුණි. නමුත් ගංවතුර වැනි ස්වාභාවික විපත් අරඹයා එම පාලම් නිරන්තරයෙන් නඩත්තු කරන්නට එකල පාලන ඒකකයට සිදුවිය. එපමණක් නොව ප්‍රධාන අගනගරයේ පාලන තන්ත්‍රය නිසිලෙෂ පවත්වා ගෙනයාමටද එය ගැටළුවක් විය. එමනිසා තත්කාලීන තාක්ෂණය භාවිතා කරමින් බාදන ප්‍රතිරෝධී පාෂාණ යොදා පාලම් ඉදිකරන්නට තාක්ෂණික ශිල්පීහු උත්සුක වූහ. එවැනි පාලම් 20 කට ආසන්න ප්‍රමාණයක් මේතාක්කරන ලද ගවේෂණවලින් අනාවරණය වී ඇත. අනුරාධපුරයෙන් උතුරු දෙස වූ මල්වතු ඔය හරහා ඉදිවූ ගල් පාලම හා මිහින්තලය කණදරා ඔය හරහා ඉදිවූ පාලම පැරණි ගල් පාලමක වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මූලිකව අධ්‍යයනය කිරීම සඳහා වැදගත් මූලාශ්‍රයෝ වෙති. මීට අමතරව අනෙකුත් ස්ථානවලද ශේෂ වී ඇති ගල් පාලම් පිළිබඳ සාධක දැකගත හැකිය.

මෙහිදී සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම පුරාවිද්‍යා මූලාශය කෙරෙහි අවධානය යොමුකරමින් පුරාණ ගල් පාලම් පිහිටි ප්‍රදේශ ගවේෂණයකර පර්යේෂණය සඳහා තොරතුරු රැස්කිරීමට අපේක්ෂිතය. සමකාලීන තාක්ෂණික ශිල්පීන් පාලම් ඉදි කළයුත්තේ කුමන ස්ථානයේ ද, එහි දිග පළල, ගල් කණු පොළව මත රැඳවිය යුතු ප්‍රමාණ, ඒ මතුපිට පාෂාණ පුවරු ඇතිරීම, කුඩුම්බි භාවිතය යන තාක්ෂණික සාධක පිළිබඳ සැලකිලිමත් විය. එසේම එම සාධක තීරණය කිරීමේදී අදාළ පරිසරය, භූ විෂමතාව, කාලගුණ හා දේශගුණ විපර්යාස, ජල ප්‍රවාහයේ ස්වභාවය හා ස්වාභාවික සම්පත් යන සාධක කෙරෙහිද අවධානය යොමුකර ඇත. එබැවින් අවශ්‍යතාව පමණක් සැලකිල්ලට නොගෙන සම්පත් නිසිලෙස කලමණාකරණය කරගනිමින් සුදුසුම ස්ථානයේ නිවැරදි ලෙස ගල් පාලම් ඉදිකිරීමට නිර්මාණ ශිල්පීහු කටයුතු කළහ.

පුරාණ ලක්දිව මාර්ග සඳහා පාලම් තැනීමේදී සුවිශේෂ තාක්ෂණයක් භාවිතකර ඇති අතර වාස්තු විද්‍යාත්මක අතින් නිවැරදි ඉදිකිරීම් ලක්ෂණ ඒ තුළ විද්‍යමාන වන බව ද පැහැදිලිව දැකගත හැක.

ප්‍රමුඛපද: *අනුරාධපුරය, ගල් පාලම, මාර්ග, පාෂාණ*